# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk e-mail: info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/ EDR/PRE/2024/21 | ඔබේ අංකය : | දිනය : 2024.08. 04 |
| எனது இல. : | உமது இல.: | திகதி : |

චක්‍රලේඛ අංක - 06

තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්,
ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම - 2024
ඡන්ද විමසීම් ප්‍රචාරක කාර්යාල පිහිටුවීම

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ දී නිවේදිත ඡන්ද කාර්යාල පවත්වා ගෙන යාමේ දී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීම වස් මෙම ලිපිය නිකුත් කරනු ලැබේ.

02. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73(1) සහ (2) උපවගන්ති යටතේ පවත්වාගෙන යා හැකි ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් වූ විධිවිධාන මෙසේ ය.

"73(1) තෝරා පත්කර ගැනීමක අපේක්ෂකයකුට හෝ ඒ අපේක්ෂකයාගේ නියෝජිතයා ද වන තැනැත්තකුට,

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ නාමයෝජනා කිරීමේ දිනයෙන් ආරම්භව ඒ ඡන්දය සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිවම ඇති දිනයෙන් අවසන් වන කාලය ඇතුළත එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය;

(ආ) ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව වූ දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිවම එන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත ඒ මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද ප්‍රදේශයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය.

73(2) "යම් අපේක්ෂකයකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාගේ සාමාන්‍ය පදිංචි ස්ථානය කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම (1) වන උප වගන්තියේ විධි විධාන උල්ලංඝණය කිරීමක් නොවන බව සැලකිය යුතු ය."

03. ඒ අනුව පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල ස්ථාපිත කළ යුතු ආකාරය පහත දැක්වේ.


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
E-mail: comelesl@sltnet.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
e-mail: cge@elections.gov.lk

අතිරේක මැතිවරණ කොමසාරිස්
(නීති, විමර්ශන හා සැලසුම්)
மேலதிகத் தேர்தல்கள் ஆணையாளர்
(சட்டம் , விசாரணைகள் மற்றும் திட்டமிடல்)
දුරකථන/தொலைபேசி 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868443

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73 වන වගන්තිය යටතේ කාර්යාල පිහිටුවීම පිළිබඳ විස්තර සටහන

| පිහිටුවිය හැකි කාර්යාල වර්ගය | කාර්යාල පිහිටුවීමට බලය ඇති අය | කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය | කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය | පිහිටුවිය හැකි කාර්යාල ගණන | අයදුම් පත්‍රයේ වර්ණය |
|---|---|---|---|---|---|
| නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාල | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි | ලා රෝස |
| නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (i) | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.19 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ඡන්ද කොට්ඨාසය | ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | සුදු |
| නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (ii) * | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත | 2024.09.20 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ඡන්ද ප්‍රදේශය | ඡන්ද ප්‍රදේශයකට එකක් බැගින් | කහ |
| සාමාන්‍ය පදිංචි නිවස, කාර්යාලය ලෙස | අපේක්ෂක/ බලයලත් නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි | ලා දම් |

* ඡන්ද ප්‍රදේශයක් සඳහා පිහිටුවන නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය 2024.08.15 දින සිටම පවත්වාගෙන යා යුතු නම් එම කාර්යාලය පිහිටුවන ඡන්ද කොට්ඨාසය සඳහා නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් වෙනත් ස්ථානයක පවත්වා ගෙන යා නොහැක.

ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව ම වූ දිනයත් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම එන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත ඒ මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද ප්‍රදේශයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය.

කාරුණු පැහැදිලි කිරීම

I. මැතිවරණ කොට්ඨාසය

අංක 1 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සිට අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාසය දක්වා වූ මැතිවරණ කොට්ඨාස 22 මෙම නමින් හැඳින්වේ. එක් එක් මැතිවරණ කොට්ඨාසය අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වෙන අතර වවුනියාව, මන්නාරම, මුලතිව් පරිපාලන දිස්ත්‍රික්ක තුනටම අදාළ බල ප්‍රදේශය අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද, යාපනය සහ කිළිනොච්චි පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අදාළ බල ප්‍රදේශය අංක 10 යාපනය මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක 13 දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙන් හැඳින්වේ.

II. ඡන්ද ප්‍රදේශය

උතුරු කොළඹ, මතුගම, රත්තොට, අම්බලන්ගොඩ ආදී වශයෙන් පැරණි මැතිවරණ කොට්ඨාස හඳුන්වනු ලබන්නේ ඡන්ද ප්‍රදේශය වශයෙනි. දිවයිනේ ඡන්ද ප්‍රදේශ 160 ක් ඇත.

III. ඡන්ද කොට්ඨාසය

යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා සුදුසුකම ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාසය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාස ගණනාවක් ඇති අතර, අංක 1 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාසය අනුව ඡන්දහිමි නාමලේඛනය බෙදා වෙන් කළ හැකිය. දිවයිනේ මුළු ඡන්ද කොට්ඨාස ගණන 13,314 කි.

IV. ඡන්ද නියෝජිත

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 31(1) වගන්තිය අනුව අපේක්ෂකයා විසින් නාමයෝජනා දින හෝ එදිනට පෙර ඡන්ද විමසීමට අදාළව (මුළු දිවයින වෙනුවෙන්ම) තමාගේ නියෝජිත වශයෙන් පත්කරනු ලබන පුද්ගලයා මෙ නමින් හැඳින්වේ. අපේක්ෂකයකු වෙනුවෙන් එවැනි පත්කිරීමක් කරනු ලැබ නොමැති විටක ඒ අපේක්ෂකයා විසින් තම ඡන්ද නියෝජිතයා වශයෙන් තමාම පත්කර ගනු ලැබ ඇති ලෙස සලකනු ලැබේ.

V. බලයලත් නියෝජිත

මැතිවරණ කොට්ඨාසයකට එක් අයෙකු බැගින් අපේක්ෂකයා හෝ ඔහුගේ ඡන්ද නියෝජිතයා විසින් පත්කරනු ලබන පුද්ගලයා මෙ නමින් හැඳින්වේ. නාමයෝජනා දින සිට සතියක් ඇතුළත මෙම අය පිළිබඳ පත්කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත ලිඛිතව දැනුම දිය යුතු ය. (32(1)වගන්තිය)

VI. ප්‍රාදේශීය නියෝජිත

බලයලත් නියෝජිතයා විසින් මැතිවරණ කොට්ඨාසයට අදාළ එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය නියෝජිතයකු බැගින් පත් කළ හැකි අතර, එම පත්වීම පිළිබඳව නාමයෝජනා දින සිට සති දෙකක් ඇතුළත තේරීම්භාර නිලධාරියා වෙත ලිඛිතව දැනුම දිය යුතු ය. (32(2)(1)වගන්තිය)

04. මෙම සෑම කාර්යාලයක්ම නිවේදිත කාර්යාලයක් විය යුතු අතර, නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දීම වන අතර ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ. ඡන්ද ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන භූමියේ හැර අනිකුත් ස්ථානවල අත් පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර හා ඡායාරූප ආදිය නාමයෝජනා කාලය ආරම්භ වූ දින සිට ඡන්ද විමසීම දිනයට පෙර දින දක්වා ප්‍රදර්ශනය කළ නොහැක. නිවේදිත ඡන්ද කාර්යාල පරිශ්‍රයක ඇතුළත සීමාව තුළ පමණක් සැරසිලි කිරීම, කොඩි, බැනර් ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලබා දෙන අතර, කිසිදු විටක මහා මාර්ගය හරහා මහා මාර්ගය මත, පදික වේදිකාවේ, විදුලි රැහැන් කණුවල සැරසිලි කිරීමට ඉඩ ලබා නොදේ. වෙනත් කිසිඳු ස්ථානයක මැතිවරණ ප්‍රචාරක පුවරු හෝ ධජ, පතාක යනාදිය ප්‍රදර්ශනයට ඉඩ දෙනු නොලැබේ. නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම දීම සඳහා මෙ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් තුනකින් (3) සම්පූර්ණ කර තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර. ඉන් එක් පිටපතක් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් රඳවා ගනු ලැබේ. ඉතිරි පිටපත් දෙක (2) අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් දෙක මගින් කාර්යාලය පිහිටුවීමට අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන එක් පිටපතක් පමණක් ඉල්ලුම්කරු වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දෙනු ලබන අවසරය ඇතුළත් ආකෘතිය සෑමවිටම කාර්යාලය පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ කාර්යාලයේ නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි අයුරින් තබා ගත යුතු වේ.

05. අපේක්ෂකයකුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට තම පදිංචි නිවසේ නැතහොත් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති නිවසේ ඡන්ද කාර්යාලයක් පිහිටුවීමට හිමිකම ඇති අතර, තම පදිංචි නිවස ජනාකීර්ණ බවෙන් අඩු ප්‍රදේශයක පිහිටා ඇත්නම් පමණක් ඉහතින් දක්වා ඇති පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම නිවස පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම තුළ වෙනත් ස්ථානයක මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවා ගත හැකිය. අදාළ ග්‍රාම නිලධාරී වසමින් බැහැරව " නිවස" ලෙස ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර දෙනු නොලැබේ.

06. මෙම කිසිදු කාර්යාලයක් රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පිහිටුවිය නොහැකිය. එසේ වුවද, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලබා දී ඇති තවමත් රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් පැවැත්වීමට අවසර ලැබේ. තවද, මෙවැනි වාසස්ථානයක අපේක්ෂකයකු පදිංචි නැත්නම් එවැනි ස්ථානයක කාර්යාලයක් පැවැත්වීමට ඉඩ දිය නොහැක.

07. විධිමත් ලෙස අවසරය ලබාගෙන පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල භූමි තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයට ප්‍රචාරක පුවරු, කටවුට්, දැන්වීම, ඡන්ද සලකුණු ආදිය ප්‍රදර්ශනයට ඉඩ ලබා දීමට තීරණය කර ඇති නමුත් කාර්යාලයට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. පෙර සඳහන් එකඟතාව මත ලබා දී ඇති අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම, ප්‍රචාරක පුවරු, ප්‍රදර්ශනය කළ නොහැකිය යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.

08. යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ඡායාරූප, ඡන්ද සලකුණු, පෝස්ටර්, කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම සපුරා තහනමය. වෙනත් අපේක්ෂකයකුගේ හෝ කිසිදු වෙනත් දේශපාලනඥයකුගේ ඡායාරූප, නම, ඡන්ද ලකුණු, ආවේනික වැකි ප්‍රදර්ශනය කරනු ලබන්නේ නම් එය අනවසර කාර්යාලයක් ලෙස සලකා ඉවත් කරනු ලබනු ඇති අතර, නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

09. කිසිදු අවසරලත් ඡන්ද කාර්යාලයක් තේරීම්භාර නිලධාරි කාර්යාලය, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පොලිස් ස්ථාන වැනි සෘජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය. අපේක්ෂකයකුගේ නිවස මෙම සීමාව තුළ පිහිටා ඇත්නම් පෙර සඳහන් දුර සීමා පිළිබඳ නියමය එහි දී බල නොපැවැත් වේ. එමෙන්ම රජයේ පාසල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබා ගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරතවන දරුවන්ට බාධාවන සේ රජයේ පාසල් ආසන්නයේම ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ස්වකීය ප්‍රාදේශීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුම්වත් කරන ලෙස සියලුම අපේක්ෂකයන්ගෙන්/ ඡන්ද නියෝජිතයන්/ බලයලත් නියෝජිතයන්ගෙන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. කෙසේ වුවද, රාජ්‍ය ආයතනවල හෝ පාසල්වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවන කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

10. සෑම අවසරලත් කාර්යාලයකම බිම් වර්ගඵලය අවම වශයෙන් 10'X10' ප්‍රමාණයේ හෝ විය යුතු ය. එනම, අවම වශයෙන් වර්ග අඩි 100 ක බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතු ය. එමෙන්ම කාර්යාලයක උස අවම වශයෙන් අඩි 8 ක් වත් විය යුතු වේ. තවද, අවසරලත් ඡන්ද කාර්යාල ලෙස හිස් ඉඩම් වල ඉදි කරනු ලබන වර්ගඵලය 10'X10' ට වඩා අඩු කුඩා තාවකාලික වකරන් මඩු නැතහොත් එවැනි කුඩා පොල්අතු පැල්පත් හෝ අත්හැර දමා ඇති ගොඩනැගිලි පෙන්වමින් අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු නොලැබේ.එසේවුවද, යම නාගරික ප්‍රදේශයක ස්ථිර කඩ කාමරයක් වැනි ගොඩනැගිල්ලක වර්ග ප්‍රමාණය වර්ග අඩි 75 දක්වා අඩු වුවද මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා එවැනි ස්ථානයක අවසරලත් ඡන්ද කාර්යාලයක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳව සලකා බැලිය හැකිය.

11. මෙලෙස පිහිටුවනු ලබන කාර්යාලයේ කිසිම විටක ශබ්ද විකාශන යන්ත්‍ර හෝ කටහඩ විස්තාරණය කිරීම හෝ ප්‍රතිඋත්පාදනය කරන මෙගා ෆෝන් වැනි යන්ත්‍ර හෝ භාවිතා කිරීම නොකළ යුතු ය. එසේ කිරීමට අවශ්‍ය වන්නේ නම් නීත්‍යානුකූලව අවසර ලබා ගත යුතු ය. සෑම කාර්යාලයක්ම අවම වශයෙන් දිනකට පැය 4 ක් වත් විවෘතව තැබිය යුතු අතර, පැය 0600 සිට පැය 2200 දක්වා වූ කාලසීමාවෙන් බැහැරව ඡන්ද කාර්යාල විවෘතව තැබීමෙන් වැළකිය යුතු ය.

12. තවද, මෙවැනි ඡන්ද කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්වීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහාය ලබා දිය යුතු ය. ඔවුන්ට බාධා කිරීම ඡන්ද විමසීම පැවැත්වීමට බාධා කිරීමක් සිදු කළා සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

13. ආගමික සිද්ධස්ථාන සතු ඉඩම්වල හෝ ආගමික ස්ථාන සතු ගොඩනැගිලිවල ඡන්ද කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු අතර, එවැනි ස්ථානවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩ දෙනු නොලැබේ. කිසිම හේතුවක් නිසාවත් ආගමික වතාවත් සිදු කරන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර ලබා දෙනු නොලැබේ. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතෙහි 78(2) උපවගන්තියේ සඳහන් අයුතු බලපෑම සම්බන්ධයෙන් වූ

නියමවලට අනනුකූල ක්‍රියා සිදුවිය හැකි ස්ථානවල දී ඡන්ද කාර්යාල පිහිටුවීමට හෝ ඡන්ද කාර්යාල ලෙස පවත්වාගෙන යෑමට අවසරය ඉල්ලීමෙන් වැලකී සිටින ලෙස දන්වා සිටිනු ලැබේ.

14. මෙම නියම කිරීම හේතුවෙන් පූර්ව ඡන්ද විමසීම්වල දී කලක් තිස්සේම ඡන්ද කාර්යාල ලෙස පවත්වනු ලබන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇතිවන්නේ නම් හා ඡන්ද කොට්ඨාසය තුළ ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් නැතිනම් ඒ සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කර මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා ගත හැකිය.

15. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම කාලසීමාව තුළ ඡන්ද විමසීම හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම පිණිස මැතිවවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. පොලිස්පති - දැන ගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණික වනු පිණිස

2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) - දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස

3. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර හා නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඡන්ද විමසීම නීති උල්ලංඝණය වීම පිළිබඳ විමර්ශනය කිරීමේ නිලධාරීන් - දැනගැනීම සඳහා සහ බලයලත් නියෝජිතයන් දැනුවත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපතක් ලබා දීමට සහ ඉල්ලීම කරන අවස්ථාවන් හි දී නියමිත වර්ණයෙන් යුක් අයදුම්පත් ලබා දීම සඳහා යා කිරීම වස්

4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැන ගැනීම සඳහා

5. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ - දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

6. මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත - නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

7. ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී - මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ පැමිණිලි විමර්ශන කාර්යාලය

(රෝස) ආකෘති අංක 1

**ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත හෝ බලයලත් නියෝජිත විසින් ඉල්ලීම කළ යුතුය**

.........................................................................................
(ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත - නම )

ලිපිනය : .........................................................................................

.........................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් තුනෙහිම ග්‍රාම නිලධාරී සහතිකය සටහන් තබා ගත යුතු වේ. ඉන්පසු පිටපත් තුනම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර මැතිවරණ කාර්යාලයේ නිර්දේශය සහිත පිටපත් දෙකක් ලබා දෙනු ඇත. එම පිටපත් අදාළ පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ විට, පොලිස් ස්ථානාධිපතිගේ සටහන් සහිත එක් පිටපතක් ඉල්ලුම්කරුට නිකුත් කරනු ඇත. එය/පක්ෂ කණ්ඩායම් කාර්යාලයේ තබා ගත යුතු ය.

2024.......................

**තේරීම්භාර නිලධාරී,** ........................................ මැතිවරණ කොට්ඨාසය

......................................................................... (පරිපාලන දිස්ත්‍රික්කය)

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ........................... (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## ජනාධිපතිවරණය - 2024
## ඡන්ද කාර්යාල පිහිටුවීම

............................................................ ..........................
ජනාධිපතිධුර අපේක්ෂකගේ නම — මැතිවරණ කොට්ඨාසය

1. කාර්යාල වර්ගය : **නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලය**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   2.1. ඡන්ද විමසීම් කාර්යාලයේ ලිපිනය : .........................................................................
   .........................................................................
   2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .........................................................................
   2.3. 2.3.1 එම ලිපිනයට අදාළ ඡන්ද ප්‍රදේශය : ................................. 2.3.2 ඡන්ද කොට්ඨාස අංකය : .................
   2.3.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..........................................................
   2.4. එම ලිපිනයේ හිමිකාරීත්වය
   (මෙම ස්ථානයේ යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
   2.4.1 හිමිකරුගේ නම : .........................................................................
   2.4.1.1 හිමිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
   2.4.2 හිමිකරුගේ තැපැල් ලිපිනය : .........................................................................
   .........................................................................
   2.4.3 හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා අත්සන : ..........................................................
   2.4.4 හිමිකරුගේ දුරකථන අංක : නිවස - ................................. ජංගම - .................................

3 **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව ජනාධිපතිධුර අපේක්ෂක ................................ ................................ ස්වාමින්වහන්ස/ මහතා/ මහත්මිය වෙනුවෙන් .......................... මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙකී කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී ජනාධිපතිධුර අපේක්ෂකයා වෙනුවෙන් පිහිටුවන මෙම කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

.........................................................................
(ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත - අත්සන)

දිනය : ..............................

## කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය :
..........................................
..........................................
..........................................

ඡන්ද කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද ප්‍රදේශය .................................. වන බවත් ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් අඩි 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ට වැඩි) සහ උස අඩි 8' ට වැඩි වන බවත් යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටේ සඳහන් දුර සීමා තුළ පිහිටා නැති බවත් ..................................... පොලිස් බල ප්‍රදේශයට අයත් බවත් වාර්තා කරමි.

..............................................
ග්‍රාම නිලධාරී අත්සන

නිල මුද්‍රාව
දිනය : .......................................

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

පොලිස් ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, ..............................................

ඉහත කී ඉල්ලීමට අදාළ .................... ඡන්ද ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාස අංක ............ යේ ජනාධිපතිධුර අපේක්ෂක ........................................ .................................. ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය විසින් වෙනත් ඡන්ද කාර්යාලයක් පවත්වාගෙන යන/ නොයන බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි.

..............................................................
තේරීම්භාර නිලධාරී/ සහකාර තේරීම්භාර නිලධාරී
........................................ දිස්ත්‍රික්කය

දිනය : ........................................ නිල මුද්‍රාව

---

## අදාළ පොලිස් ස්ථානාධිපතිගේ ප්‍රයෝජනය සඳහා *

..............................................................................................................
(ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත - නම)
කාර්යාලය පිහිටුවීමේ නිවේදනය භාර ගන්නා ලදී.

නිල මුද්‍රාව

..................................................
පොලිස් ස්ථානාධිපතිගේ අත්සන
පොලිස් ස්ථානය, .............................................. දිනය : ........................................

(* මෙම කාර්යාලය පිහිටුවීමට යම් බාධාවක් නිසාවෙන් ඔබ විරුද්ධ වන්නේ නම් ඒ බව හැකි ඉක්මණින් දුරකථන අංක ................................ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අමතා එහි සිටින ........................................................ මහතා/ මහත්මිය දැනුවත් කරන්න.)

---

### උපදෙස් :

1. 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73 වගන්තියෙන් ඡන්ද කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. එසේම 74 වගන්තියෙන් ඡන්ද විමසීමට අදාළව රැස්වීමක් පවත්වන ස්ථානයක් තුළ හෝ ඒ ස්ථානයෙහි හා අපේක්ෂකයෙක් ගෙන යෑම සඳහා භාවිතා කරන වාහනයක් තුළ හෝ ඒ මත හැර වෙනත් කිසිඳු ස්ථානයක අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් හෝ ප්‍රදර්ශනය කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත. මැතිවරණ කොමසාරිස්වරයා හා දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2005 වර්ෂයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයට අදාළ සාකච්ඡාවල දී පැමිණි එකඟතාවකට අනුව නිසි අවසරයෙන් පිහිටුවන ඡන්ද කාර්යාල පරිශ්‍රය තුළ නිශ්චිතව දක්වන ලද ප්‍රමාණය හා විස්තරයට අනුකූලවන පරිදි එක් ප්‍රචාරක පුවරුවක්, අපේක්ෂකයා භාවිතා කරන වර්ණයෙන් යුතු කොඩි තුනක් පමණක් ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දී ඇත. ***මෙම අවසර ලබා දෙන්නේ පහත අවශ්‍යතා සපුරමින් යහපාලනය පවත්වාගෙන යන නීත්‍යානුකූලව පිහිට වූ ඡන්ද කාර්යාලය සඳහා පමණක් බව අවධාරණය කරනු ලබන අතර, එසේ නොවන අවස්ථාවල දී එම කාර්යාලවල කිසිඳු අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා අවසර නොදෙන අතර, ඡන්ද විමසීම් කාර්යාල පමණක් පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ.***

2. මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ක්) හා උස අඩි 8' ක් විය යුතු අතර, කාර්යාලය නියමිත බලය ඇති කාල සීමාව තුළ නිසි අවසරය ඇති සෑම දිනකම අවම වශයෙන් දිනකට පැය 4ක් වත් විවෘතව පවත්වාගෙන යා යුතු ය. (කාර්යාල විවෘත කර තැබිය හැක්කේ උපරිම වශයෙන් පෙ.ව.6.00 සිට ප.ව.10.00 දක්වා පමණි.)

3. පොලීසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුල ප්‍රදර්ශනය කර තිබිය යුතුය .එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

4. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලය | එක් ජනාධිපතිධුර අපේක්ෂකයෙකුට මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් | 2024.08.15 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා |

5. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරී වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරී වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

6. මෙවැනි නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා 2024.09.18 දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.

7. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් 2024.09.18 දින මධ්‍යම රාත්‍රියේ සිට එහි ප්‍රදර්ශනය කරන සියලුම අපේක්ෂක ප්‍රවර්ධන ද ඉවත් කළ යුතු ය.

8. කිසියම් අපේක්ෂකයෙකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදු නොකළ යුතු ය.

9. කිසිදු අවසර ලත් ඡන්ද කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිස් ස්ථානය වැනි සෘජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය.

10. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස අපේක්ෂකයන්ගෙන් හා ක්‍රියාකාරී අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතන වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

(සුදු) ආකෘති අංක 2

**ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත හෝ ප්‍රාදේශීය නියෝජිත විසින් ඉල්ලීම කළ යුතු ය**

...............................................................................................
(ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත - නම )

ලිපිනය : ...............................................................................................

...............................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් තුනෙහිම ග්‍රාම නිලධාරී සහතිකය සටහන් තබා ගත යුතු වේ. ඉන්පසු පිටපත් තුනම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර මැතිවරණ කාර්යාලයේ නිර්දේශය සහිත පිටපත් දෙකක් ලබා දෙනු ඇත. එම පිටපත් අදාළ පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ විට, පොලිස් ස්ථානාධිපතිගේ සටහන් සහිත එක් පිටපතක් ඉල්ලුම්කරුට නිකුත් කරනු ඇත. එය/පක්ෂ කණ්ඩායම් කාර්යාලයේ තබා ගත යුතු ය.

2024........................

තේරීම්භාර නිලධාරී, ............................................ මැතිවරණ කොට්ඨාසය

............................................................................ (පරිපාලන දිස්ත්‍රික්කය)

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ........................... (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ජ.කො. අංකය |
| | |

**ජනාධිපතිවරණය - 2024**

**ඡන්ද කාර්යාල පිහිටුවීම**

.......................................................... ...........................

ජනාධිපතිධුර අපේක්ෂකගේ නම මැතිවරණ කොට්ඨාසය

1. කාර්යාල වර්ගය : **නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය**

**(2024.09.19 දින මධ්‍යම රාත්‍රිය ඉකුත්වීමට පෙර ඉවත් කල යුතුය.)**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. ඡන්ද විමසීම් කාර්යාලයේ ලිපිනය : ...............................................................................................................
   - 2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ..........................................................................
   - 2.3. 2.3.1 එම ලිපිනයට අදාළ ඡන්ද ප්‍රදේශය : .................................. 2.3.2 ඡන්ද කොට්ඨාස අංකය : ................
     - 2.3.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..........................................................................
   - 2.4. එම ලිපිනයේ හිමිකාරීත්වය
     (මෙම ස්ථානයේ යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1 හිමිකරුගේ නම : ..........................................................................
       - 2.4.1.1 හිමිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
     - 2.4.2 හිමිකරුගේ තැපැල් ලිපිනය : .............................................................................................................
     - 2.4.3 හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා අත්සන : ..........................................................
     - 2.4.4 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................. ජංගම - .................................

3 ප්‍රකාශය

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව ජනාධිපතිධුර අපේක්ෂක ................................. ................................ ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය වෙනුවෙන් ........................... මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙකී කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී ජනාධිපතිධුර අපේක්ෂකයා වෙනුවෙන් පිහිටුවන මෙම කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

..........................................................................................................
(ජනාධිපතිධුර අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත - අත්සන)

දිනය : ................................

**කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව**

කාර්යාලයීය ලිපිනය :

.............................................

.............................................

.............................................

